# 23. කියෝටෝ කතිකාවත

**කි**යෝටෝ කතිකාවද ඕසෝන් විවරය තරම්ම ලොව පසිඳුය. වායුගෝලයට කාබන් ඩයොක්සයිඩ් නිකුත් කිරීම 5% කින් පමණ අඩු කිරීම කියොටෝ ගිවිසුමේ මූලික අරමුණ විය. එහෙත් අමෙරිකා එක්සත් ජනපදය, ඔස්ට්‍රෙලියාව, මොනාකෝ හා ලයිච්ටෙන්ස්ටයින් යන සතර රාජ්‍යයෝ මේ ගිවිසුමෙන් බැඳීම ප්‍රතික්ෂෙප කලෝය. ගිවිසුමේ විධිවිධාන වලින් බැඳීමට ඇති අනිවාර්ය අවශ්‍යයතාව මේ රටවල් සතරේ දැඩි විවේචනයට ලක්විය. ඇයි මේ විරෝධයට හේතුව?

බලශක්තිය අලෙවි කිරීම බෙහෙවින් ලාභ උපදවන ව්‍යාපාරයකි. සංවර්ධනය වන රට වල බලශක්ති ඉල්ලුමේ දල වර්ධනය වසරකට 2% නොවැඩිය. මේසා අඩු වර්ධන වේගයකින් යුත් වෙළඳ පලක සුළං, න්‍යෂ්ඨික, ගෑස්වායු, ගල්අඟුරු ආදී විවිධ බලශක්ති ප්‍රභේද අතුරෙන් සුදුසු එකක් හෝ දෙකක් පමණක් ඉස්මතුවීම යනු අනෙකුත් බලශක්ති ප්‍රභේද අලෙවිකරුවන්ට තදබල තර්ජනයකි. කියෝටෝ ඉලක්ක ඇතැම්විට ලෝක බලශක්ති වෙළඳපල වෙනස්කිරීම කරා යොමුවීමට ඉඩ තිබුනු බැවින් ගිවිසුමේ යෝජිත ප්‍රතිපාදන විරාගත බලශක්ති අලෙවිකරුවන්ගේ දැඩි නොකැමැත්තට හේතු විය.

පෘථිවියේ පැවැත්ම උදෙසා ජාත්‍යයන්තර ගිවිසුමක් අත්‍යවශ්‍ය බව විශ්වාස කළ අයත් දේශපාලනික ආර්ථික හේතුමත එවැනි ගිවිසුමකට සැහැසි ලෙස විරුද්ධ වූ අයත් වශයෙන් පැහැදිලි දෙකොටසකට ලෝකයා බෙදීමට කියෝටෝ ගිවිසුම සමත්විය. කියොටෝ ගිවිසුම ආර්ථික වශයෙන් දෝෂ සහගත බවත් දේශපාලනික වශයෙන් යථාර්ථවාදී නොවන බවත් දෙවැනියට කී කොට්ඨාශයේ ප්‍රධාන තර්ක විය. තවත් අයෙක් දේශගුණික

විපර්යාසය පිළිබඳ ගැටළුව මුළුනින්ම අනා අවුල්කර දමන ලද අතිශයෝක්තියකැයි විශ්වාස කළහ.

කියුටෝ කතිකාව තවම එහි මූලික අවස්ථාව ඉක්මවා තීරණාත්මක ප්‍රතිඵල ලබාගෙන නොමැත. එහෙත් කිනම් මතභේදයන් තිබුණද කියොටෝ කතිකාව ඉදිරි දශක කිහිපය තුළ ජාතීන් විසින් අනුගමනය කළ යුතු, වත් පිළිවෙත් පිළිබඳව සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමට සමත් ව ඇති බව පිළිගත යුතුය.

කියොටෝ කතිකාවට මඟ පෑදුනේ 1985 දී ඔස්ට්‍රියාවේ විලාච් නගරයේ පැවැති ජාත්‍යන්තර විද්‍යා සමුළුවයි. මේ සමුළුවේදී දේශගුණ විපර්යාසය පිළිබඳව ප්‍රථම ප්‍රාමාණික විද්‍යාත්මක විශ්ලේෂණය තදින් සාකච්ඡාවට ලක් විය. ඉන් අනතුරුව 1992 දී රියෝ ඩි ජනයිරෝ නගරයේ පැවැති ලෝක පරිසර සම්මේලනයේදී රටවල් 155ක් UNFCC යන කෙටි යෙදුමෙන් හඳුන්වන "දේශගුණය වෙනස්වීම සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සම්මුතික රාමුව" (UN Framework Convention on Climate Change) ට සිය එකඟත්වය පළකරමින් අත්සන් තැබීය. වසර 2000 වන විට වායුගෝලයට නිකුත් කරන හරිතාගාර වායු ප්‍රමාණය මේ සම්මුතියට අනුව එම රටවල් විසින් වසර 1990 පැවැති මට්ටමට අඩුකල යුතු විය. බෙහෙවින් සුබවාදී ලෙස පෙණුණ මෙය දැඩි කැප කිරීමක් නොකර ළඟා කරගැනීමට අසීරු වූ ඉලක්කයකි.

සම්මුතිය අත්සන් කල රටවල් අතර පස් වසරක් තිස්සේ පැවැති කතිකා, සාකච්ඡා වලින් අනතුරුව 1997 දෙසැම්බර් මාසයේදී ජපානයේ කියෝටෝ නගරයට රැස්වූ නියෝජිත සමුළුව හරිතාගාර වායු නිකුත්වීම අඩුකිරීම පිළිබඳව නව ගිවිසුමක් සකස් කළේය. කියොටෝ මූලලේඛය (Kyoto Protocol) යනුවෙන් හැඳින් වුණු මේ ලේඛණය එක් එක් රටවල් විසින් වෙන වෙනම අපරානුමත (ratify)කළ යුතු විය. කියෝටෝ මූලලේඛය වැදගත් සම්මුති දෙකක් ඉදිරිපත් කළේය. ඉන් එකක් දියුණු රටවලින්

නිකුත්වන නොහොත් විප්‍රෙෂණයවන හරිතාගාර වායු ප්‍රමාණය සඳහා සීමා ඇතිකිරීම හා සම්බන්ධය. අනෙක ඩොලර් බිලියන 10ක තක්සේරු වටිනාකමක් ඇති විප්‍රෙෂණ අලෙවිකර ගැනීමේ විධික්‍රමයක් මගින් වැදගත්ම හරිතාගාර වායු හය වායුගෝලයට මුසුවීම සීමා කරගැනීමයි.

මේ විප්‍රෙෂණ අලෙවිය නව මුදල් ඒකකයක් එනම් "කාබන් ඩොලර" වශයෙන් හැඳින්විය හැකිය.

කියොටෝ මූලලේඛයට අනුව එක් එක් රටවලට සිය කාබන් අයවැය (Carbon Budget) නිර්ණය කරගැනීමට ඉඩ සැලසේ. කාබන් අලෙවි කරගැනීමෙන් (carbon trading) නොහොත් පරිසර දූෂණය වෙනුවෙන් ගෙවීම මගින් සිය විප්‍රෙෂණ ප්‍රමාණය සවල ලෙස අඩු කර ගැනීමට කම්හල් හිමියන්ට එම විධිවිධාන අනුව ඉඩ සැලසේ. මේ අනුව ව්‍යාපාර වලට සිය කාබන් විප්‍රෙෂණ අඩුකර ගැනීම මගින් කාබන් බැර ඒකක (carbon credits) උපයාගත හැකි වන අතර එම කාබන් බැර ඒකක පරිසරය වඩා දූෂණය කෙරෙන කාර්මික ව්‍යපාර වලට අලෙවි කර හැකිය. ඒ මගින් සිය කාබන් විප්‍රෙෂණ ප්‍රමාණය අඩු කිරීමට කටයුතු යොදන කාර්මික ව්‍යාපාර දිරි ගැන්වෙන අතර කාබන් විප්‍රෙෂණ ප්‍රමාණය අඩු කිරීමට අසමත් කර්මාන්තවල නිෂ්පාදන වියදම ඉහළ යනු ඇත.

යටකී විධිවිධාන යහපත් ප්‍රතිඵලගෙන දෙන සුළු වුවද කියටෝ මූලලේඛය ලොවපුරා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කෙරෙන එය අපරානුමත කල රටවල් සංඛ්‍යාව සම්පූර්ණ කර ගැනීමට ඉන් වසර හතක් ගතවෙන තෙක් එනම් 2004 වෙන තෙක් කළ නොහැකිවිය. කියොටෝ ගිවිසුමේ කොටස් කරුවන් වූ ඔස්ට්‍රෙලියාව හා අමෙරිකා එක්සත් ජනපදය කියටෝ මූලලේඛය අපරානුමත කිරීම ප්‍රතික්ෂේප කළේය.

කියටෝ මූලලේඛය දත් නැති කොටියෙකු වැනියැයි යන සඳහන එය කෙරෙහි එල්ල වූ බලවත්ම වවේචනය ලෙස සැලකිය හැකිය. 1990 ත් 2012ත් අතර වසර විසිදෙක සඳහා එය විසින් ඉලක්ක කර තිබූ හරිතාගාර වායු විප්‍රෙෂණ ප්‍රමාණය අඩුකිරීම 5.2% කට සීමා විය. එහෙත් දේශගුණ විපර්යාසය අද එළඹ ඇති අවදානම් මට්ටම සැලකූ විට මේ සුළු ඉලක්කය කිසිසේත්ම ප්‍රමාණවත් නොවේ.

දේශගුණය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය නම් කියොටෝ මුලලේඛයේ ඉලක්කය මේ ප්‍රමාණය මෙන් දොලොස්ගුණයක් වැඩිකල යුතුය. වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය වසර 2050 වන විට 1800 පූර්ව කාර්මික යුගයේ පැවැති මට්ටම මෙන් දෙගුණයකින් පවත්වා ගැනීමට පවා කාබන් ඩයොක්සයිඩ් විප්‍රෙෂණ ප්‍රමාණය නොපමාව 70% කින් අඩුකල යුතුය. කියටෝ කතිකාවේ ඉදිරි පියවර හමුවේ ඇති විශාලතම අභියෝගය එයයි.

එක් එක් රටවල් සම්බන්ධයෙන් අනුගමනය කල යුතු විවිධ විප්‍රෙෂණ සීමා කියටෝ මූලලේඛය විසින් අනුදැන ඇත. මේ විප්‍රෙෂණ සීමා එක එක රටවලට අනුව 92% ත් 110%ත් අතර පරාසයකින් වෙනස් වේ. සංවර්ධනයවන රටවල් වශයෙන් සැලකෙන චීනය හා ඉන්දියාව ගිවිසුමේ පාර්ශවකරුවන් වුවද විප්‍රෙෂණ සීමාවන් නිර්ණය කිරීමෙන් ඒ දෙරට 2012 වසර දක්වා නිදහස් කෙරිණ.

රටවල් අතර ඇති විවිධ ආර්ථික වෙනස්කම් සැලකූවිට කියෝටෝ අරමුණු ඉටුකර ගැනීම බෙහෙවින් සංකීර්ණ කටයුත්තක් බවට පත්වේ. උදාහරණයක් වශයෙන් ගත්විට 1990 සිට සැලකිය යුතු කලක් පුරා ආර්ථික අවපාතයකට මුහුණ දුන් නැගෙනහිර යුරෝපීය රටවල් දැන් විප්‍රෙෂණය කරන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය පෙරට වඩා 25% කින් අඩුය. මේ රටවල්

සම්බන්ධයෙන් කියොටෝ විප්‍රෙෂණ ඉලක්කය 1990 පැවැති ප්‍රමාණයට වඩා 8% කින් අඩුවිය යුතු යැයි නිර්ණයනය කර ඇති බැවින් වර්තමානයේ මෙරටවල් සැලකිය යුතු කාබන් බැර ඒකක ප්‍රමාණයක් අලෙවියට ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලැබ සිටිති.

මේ කාබන් බැර ඒකක මිලදී ගැනීමට පෙළඹෙන රටවල් සිය විප්‍රෙෂණ ප්‍රමාණයට අඩුකරගැනීමට උත්සාහගනු ඇතැයි සිතීම අසීරුය. ඒ නිසා කාබන් බැර අලෙවිය හුදෙක් දේශගුණ විපර්යාසයට තුඩුදෙන හේතු අඩු කිරීමට හේතු වෙතැයි සිතිය නොහැක. ඇතැම් ආර්ථික විශේෂඥයන් පවසන පරිදි මේ කාබන් බැර ඒකක අපතේ යන ඩොලර් වශයෙන් සැලකිය හැකිවන අතර එය කාබන් විප්‍රෙෂණය අඩුකිරීමට දායක නොවෙනු ඇත. ඔවුන් තර්ක කරන පරිදි මෑතකදී ආර්ථික අර්බුදයකට මුහුණදීමේ හේතුව මත කලින් සෝවියට් ක්‍රමය පැවැති රටවලට නොකඩවා කාබන් බැර ඒකක ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම අයුතු දෙයකි.

කියටෝ මූලලේඛයට අනුව වසර 2012 දක්වා වන පළමු අවධිය තුළ විප්‍රෙෂණ සීමාවන් ගණනය කිරීමේදී යුරෝපීය සංගමයට අයත් රටවලට 1990 පැවැති ප්‍රමාණයට වඩා 8% අඩු වෙන්ද අමෙරිකා එක්සත් ජනපදයට 7% ක් අඩුවෙන්ද සීමා නිර්ණය කෙරුණි. අනෙක් අතට ඔස්ට්‍රෙලියාවට 1990 පැවැති විප්‍රෙෂණ මට්ටමට වඩා 8% ක් වැඩියෙන් කාබන් විප්‍රෙෂණය පවත්වා ගැනීමට විධිවිධාන මගින් ඉඩ සැලසීය. මෙයට වඩා වාසිදායක ඉලක්කයක් ලැබුණු අනිත් එකම රට අයිස්ලන්තයයි. 1990 පැවැති ප්‍රමාණ හා සසඳන විට 10% වැඩියෙන් කාබන් විප්‍රෙෂණ මට්ටම පවත්වා ගැනිමට අයිස්ලන්තයට ඉඩ ලැබුණි. මෙහි සාධාරණය කුමක්ද? මෙවැනි විෂම ඉලක්ක තීරණය වූයේ කෙසේද?

සියළුම කාර්මික රටවල් අතුරින් වැඩිම ඒක පුද්ගල හරිතාගාර වායු විප්‍රෙෂණය ඇත්තේ ඔස්ට්‍රෙලියාවටයි. ප්‍රමාණය

වශයෙන් බැලූවිට එය අමෙරිකානු එක්සත් ජනපදයටද වඩා 25%කින් වැඩිය.

කියොටෝ කතිකාවේදී සුවිශේෂ කරුණු මත ඔස්ට්‍රෙලියාවට සහනදායි විප්‍රෙෂණ ඉලක්ක ලබාදිය යුතු යැයි ඔස්ට්‍රෙලියානු නියෝජිත පිරිස තර්ක කළහ. ඛණිජ ඉන්ධන මත පමණක් ඔස්ට්‍රෙලියාවට යැපීමට සිදුව ඇති බවත්, එකිනෙකට බොහෝ දුරින් මහාද්වීපය පුරා විරලව පිහිටි ජනාවාස නිසා පරිවහන කටයුතු සඳහා බල ශක්තිය අධික වශයෙන් යොදා ගැනීමට සිදුව ඇති බවත් ඔව්හු පැවසූහ. හැරත් නිර්යාත භාණ්ඩ නිෂ්පාදනය මුළුමනින්ම ඛනිජ ඉන්ධන භාවිතය මත රඳා පවතින බැවින් තම රටට විශේෂ අනුග්‍රහයක් දැක්විය යුතුයැයි ඔස්ට්‍රෙලියානු නියෝජිතයෝ බලකර කියා සිටියෝය.

ඔස්ට්‍රෙලියාවේ විදුලිබල නිෂ්පාදනයෙන් 98%ක්ම රඳා පවතින්නේ ඉන්ධන වශයෙන් ගල් අඟරු යොදා ගන්නා තාප බලාගාර මතය. එහෙත් මෙය අවශ්‍යතාවයකට වඩා මනාපය මත තෝරාගන්නා ලද විසඳුමකි. ලෝකයේ න්‍යෂ්ටික බලාගාර සඳහා අත්‍යවශ්‍ය යුරේනියම් වලින් 28%ක්ම නිෂ්පාදනය කරන්නේ ඔස්ට්‍රෙලියාවේය. බලශක්තියක් වශයෙන් යොදාගත හැකි නිධිගත භූ-තාපී(Geothermal) සම්පත් අතින්ද ඔස්ට්‍රෙලියාව අතිශයින් පොහොසත්ය. හැරත් කදිම ලෙස සුළං බලය හා සූර්යතාප ශක්තිය යොදා ගැනීම සඳහා අවශ්‍යය සියළුම සාධකද ඔස්ට්‍රෙලියාව සතුවේ. පසුගිය අවුරුදු තිහක කාලයක් පුරා ඔස්ට්‍රෙලියාවේ විද්‍යාඥයන් දේශගුණ විපර්යාසය පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබුණි. මේ සියළුම තත්ත්ව නොසලකා තමන් හුදෙක් ගල් අඟුරු මත පමණක් යැපෙන්නේ යැයි පැවසීම නිසි කලට නිසි ආර්ථික තීරණ ගැනීමට ඇති අසමත් බව කියා පෑමක් නොවේද? ඒ දීනකම කිසියම් රටකට සහන සැලසීමට හේතුවක් විය යුතුද?

රට විශාලවීම හේතුකොට ප්‍රවාහණ කටයුතු සඳහා ඛනිජ ඉන්ධන අධික වශයෙන් අවශ්‍යයවෙතැයි යන තර්කයද පිළිගත නොහැකිය. මන්ද සුවිශාල රටක් වුවද ඕස්ට්‍රේලියාවේ ජනගහණය වැඩිපුරම ජීවත්වන්නේ නාගරික මධ්‍යස්ථාන වලය. ඒ නිසා ප්‍රවාහන කටයුතු සඳහා යෙදෙන ඛනිජ ඉන්ධන වලින් 60%ක් වැය වන්නේ මහ නගර ආශ්‍රිතවය. නිර්යාත භාණ්ඩ නිපදවීමේදී ඛනිජ ඉන්ධන මත යැපෙන එකම රට ඕස්ට්‍රේලියාව පමණක්ම නොවේ. කියෝටෝ මූලලේඛය ඉහළින් පිළිගත් ජර්මනිය, ජපානය හා නෙදර්ලන්තය වැනි රටවලද නිර්යාත භාණ්ඩ නිෂ්පාදනය රඳා පවතින්නේ ඛනිජ ඉන්ධන භාවිතය මතය. ඒ නිසා ඛනිජ ඉන්ධන මත යැපෙන නිර්යාත නිෂ්පාදනය හේතු කොටගෙන ඕස්ට්‍රේලියාවට පමණක් සුවිශේෂ සහන සැලසීම අයුතුය.

1997 දී කියොටෝ රැස්වීමේ නිල සභාවාරය මධ්‍යම රාත්‍රියකින් අවසන් වුවද සම්මුතියක් සඳහා පැවැති සාකච්ඡා අළුයම් ජාමය දක්වාම දිග් ගැසී ගියේය. අනතුරුව හිමිදිරියේ මූල ලේඛයේ අවසාන කෙටුම්පත සභාගත කල අවස්ථාවේදී ඕස්ට්‍රේලියානු නියෝජිත පිරිසේ නායකත්වය දැරූ සෙනට් සභික රොබට් හිල් හුනස්නෙන් නැගී සිට නවතම ඉල්ලීමක් ඉදිරිපත් කළේය. එනම් ඕස්ට්‍රේලියාව සම්බන්ධයෙන් විප්‍රෙෂණ සීමාවන් තීරණය කිරීමේදී වන වගා සංවර්ධනය සම්බන්ධයෙන්ද විශේෂ සහන සැලසිය යුතු බවයි.

ඔහුගේ තර්කයට අනුව 1990 වර්ෂයේ සිට ඕස්ට්‍රේලියාවේ කැලෑ එළිකිරීම අඩුවී ඇති අතර ඕස්ට්‍රේලියාව සිය වනාන්තර ආරක්ෂා කිරීම තුළින් කාබන් ඩයොක්සයිඩ් විප්‍රෙෂණය අඩුකිරීමට දායක වී ඇත. මේ තර්කය නැගෙනහිර යුරෝපීය රටවලට ලැබුණු අනුග්‍රහයට පාදකවූ තර්කයට අනුරූප විය. ඕස්ට්‍රේලියාවේ මේ නව ස්ථාවරයට අනුව හරිතාගාර වායු විප්‍රෙෂණය අඩුකිරීම පිණිස කිසිදු පියවරක් ගැනීමකින් තොරවම කියොටෝ මූලලේඛයේ කොටස්කරුවන් වීමට ඕස්ට්‍රේලියාවට ඉඩදිය යුතුය. මේ විතර්කය

හා එකඟ නොවුහොත් කියෝටෝ රුස්වීම එකඟත්වයකින් තොරව අවසන් කිරීමට සිදුවන බව දුටු අවශේෂ රටවල නියෝජිත කණ්ඩායම් අවසානයේදී ඕසට්‍රේලියාවේ ඉල්ලීමට එකඟවිය.

තම කෛරාටික උපායශීලීභාවය වෙනුවෙන් සෙනට් සභික හිල් ඔස්ට්‍රේලියානු පරිපාලකයන්ගේ පැසසුමට ලක් වු නමුත් කියොටෝ මූලලේඛය අපරානුමත කිරීම තත්කාලීන ඔස්ට්‍රේලියානු රජය විසින් ප්‍රතික්ෂෙප කරන ලදී. නිදහසට කරුණු වශයෙන් ප්‍රකාශ කෙරුනේ කියොටෝ මුලලේඛය අපරානුමත කළද නොකළද එහි සඳහන් නව ඔස්ට්‍රේලියානු විප්‍රෙෂණ ඉලක්ක සපුරාගැනීමට ඔස්ට්‍රේලියාවට හැකි බවයි. මේ ප්‍රකාශය ඔබ ඇතුළු අවශේෂ ලෝකයා ව්‍යාකූලයට පත් කළේ නම් එය පුදුමයට හේතුවක් නොවේ. කියටෝ කතිකාව අවුලට ලක් කිරීම අරමුණු කරගත් ආත්මාර්ථකාමය මත පමණක් පදනම් වු තත්කාලීන ඔස්ට්‍රේලියානු ස්ථාවරය පිළිබඳ කනස්සල්ල පළකිරීම හැර වෙනත් පියවරක් ගැනීමට අවශේෂ ලෝකයාට ඒ අවස්ථාවේ හැකියාවක් නොතිබිණි.

කියොටෝ මුලලේඛය අපරානුමත නොකිරීම නිසා ඔස්ට්‍රේලියාවට කාබන් බැර ඒකක අලෙවි කිරීමට අවස්ථාවක් නොලැබේ. ඔස්ට්‍රේලියාවෙන් ගල් අඟුරු බෙහෙවින් මිලදී ගන්නා ජපානය එම ගල් අඟුරු දැවීමෙන් විප්‍රෙෂණයවන කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය හිලව් කිරීමට අවශ්‍ය කාබන් බැර (carbon credit) ඒකක ප්‍රමාණය දැන් මිලදී ගත යුත්තේ ඔස්ට්‍රේලියාවෙන් නොව නවසීලන්තය වැනි තුන්වැනි රටකිනි.

කාබන් බැර ඒකක අලෙවිය ඉහලින් අනුදක්නා අය මේ නව ක්‍රමයේ ගනුදෙනුව හරිතාගාර විප්‍රෙෂණ ඉලක්ක සීමාකර ගැනිමේ වියදම සැලකිය යුතු පමණකින් අඩුකරනු ඇතැයි පෙන්වා දෙති. විප්‍රෙෂණ හිලව් කිරීම සඳහා බැර ඒකක මිලදී ගැනීමට බලකිරීම පරිසර දූෂණය අඩුකිරීම පිණිස සාර්ථක ලෙස යොදාගනු

ලැබූ අවස්ථා ඒ සඳහා උදාහරණ වශයෙන් ගෙන හැර දැක්විය හැකිය. මේ බැර ඒකක මිලට ගැනීමේ ක්‍රමය පළමුවෙන් හඳුන්වාදුන්නේ 1995දී අමරිකානු එක්සත් ජනපදයේ ගල් අඟුරු දැවීමෙන් සලපර් ඩයොක්සයිඩ් වායුව විශ්‍රේශණයවීම සීමාකිරීම සඳහාය. මේ නිසා සල්පර් ඩයොක්සයිඩ් වායුව විප්‍රෙෂණයවීම වළක්වන ක්‍රියාමාර්ග ගැනීමට සාර්ථක ලෙස ගල් අඟුරු බලාගාර පෙළඹවීමට හැකි විය.

මේ ක්‍රමයට අනුව විප්‍රෙෂණ ඒකක ගනුදෙනු කරගන්නේ මෙසේය. රටක පරිසර නියාමන අධිකාරිය එක් එක් හරිතාගාර වායුව සඳහා ඒ රටේ ක්‍රියාකාරීකම් මගින් නිකුත් කළහැකි උපරිම දූෂක වායු ප්‍රමාණය නිර්ණය කරයි. ඒ අනුව රටේ ව්‍යාපාර හා කර්මාන්තකරුවන් සඳහා ප්‍රමාණුකූල විප්‍රෙෂණ දීමනා සහතික අලෙවි කිරීම හෝ වෙන්දේසි කිරීම කරණු ලැබේ. විප්‍රෙෂණ සහතික වල සඳහන්ව ඇති දීමනා ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් සිය කාබන් බැර (carbon credit) ඒකක ප්‍රමාණය වශයෙන් සැලකීමට මේ සහතික හිමිකරුවන්ට ඉඩ ලැබේ. කෙසේවෙතත් රටක් විසින් තම රටේ ව්‍යාපාර සඳහා නිකුත් කරන විප්‍රෙෂණ දීමනාව සහ කාබන් බැර ඒකක ප්‍රමාණය යන දෙකේම එකතුව කියොටෝ මූලලේඛයට අනුව මුළු රටින්ම විප්‍රෙෂණය කල හැකි හරිතාගාර වායු දූෂක සීමාව ඉක්මවා යා නොහැක. මේ අනුව තම විප්‍රෙෂණ සීමාව ඉක්මවා යාමට කිසියම් කර්මාන්ත කරුවෙකුට හෝ ව්‍යාපාරයකට අවශ්‍ය නම් එම ව්‍යාපාරිකයා තමාට නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් හරිතාගාර වායු විප්‍රෙෂණය කරන ව්‍යාපාරයකින් කාබන් බැර ඒකක මිලදී ගතයුතුය. මේ අනුව කාබන් බැර ඒකක අලෙවි කරන ව්‍යාපාරයට තමාට නියමිත කාබන් විප්‍රෙෂණ දීමනාවෙන් අවශ්‍ය ප්‍රමාණය බැර ඒකක මිලදී ගන්නා ව්‍යාපාරිකයාට මාරු කළ හැකිය. මේ මාරු කිරීම "කාබන් අලෙවිය" යනුවෙන් හැඳින්වේ. මෙහිදී සිය අතිරේක විප්‍රෙෂණවලින් සිදුවන පරිසර හානියට වන්දි ගෙවීමට එසේ කාබන් බැර ඒකක මිලදී ගනු ලබන්නාට සිදුවන අතර තමාට

නියමිත මට්ටමට වඩා පහළින් විප්‍රෙෂණ මට්ටම පවත්වාගෙන යාමට හැකිවීම හේතු කොටගෙන කාබන් බැර ඒකක අලෙවි කරන ව්‍යාපාරිකයා සිය විප්‍රෙෂණ මට්ටම වඩ වඩා පහළින් පවත්වාගෙන යාමට උනන්දුවෙයි. පලදායී ක්‍රමයක් ලෙස මෙය සැලකීමට හේතුවන කරුණු අතර ක්‍රමයේ පාරදෘෂ්‍යභාවය, ක්‍රියාත්මක කිරීමේ පහසුව, වෙළඳ පොළ මත පදනම් වූ කාබන් මිල, නව රැකියා අවස්ථා ඇතිවීම, නිෂ්පාදන ක්‍රියාවලියේදී කාබන් විප්‍රෙෂණ අඩුකෙරෙන තාක්ෂණික විසඳුම් සෙවීම දිරි ගැන්වීම සහ අවසාන වශයෙන් දූෂණකාරක වායු විප්‍රෙෂණය සීමා කිරීම වඩා ලාභදායී ලෙස ඉටු කිරීමට හැකිවීම යන කරුණු ගැනේ.

කියොටෝ මූලලේඛයේ උග්‍ර විවේචකයන් සහ කියොටෝ වැඩපිළිවෙල අත්හැර දැමීමට යෝජනා කරන අය විසින් පිළිතුරු සැපයිය යුතු පැන දෙකක් වෙයි. කියොටෝ විධිවිධාන වෙනුවට ඔබ යෝජනා කරන විකල්පය කුමක්ද? සහ එම විකල්පය සඳහා පුළුල් ජාත්‍යන්තර සම්මුතියක් ඇතිකරගන්නේ කෙසේද? යනු ඒ පැන දෙකය. කෙසේ වෙතත් මේ දෙපැනය සම්බන්ධයෙන් නිසි පිළිතුරක් සැපයීමට මෙතෙක් කිසිවෙක් සමත් ව නැත.

**විනාශකාරී දේශගුණ විපරීතයකට එරෙහිව සටන් කිරීමට දැනට පවතින එකම ජාත්‍යන්තර සම්මුතිය කියෝටෝ මූලලේඛයයි.**